# ස්වභාවික සම්පත් වර්ගීකරණය

සම්පතක් යනු ඍජුව හෝ වක්‍රව මිනිසාට භාණ්ඩයක් හෝ සේවාවක් ලෙස ප්‍රයෝජනවත් වන්නකි (Sterner, 2003).

මෙම අර්ථ දැක්වීම ඉතාමත් පුළුල් එකක් වන අතර ඊට අදාලව පාරිසරික සම්පත් විශාල සංඛ්‍යාවක් හඳුනාගත හැකිය. මූලික වශයෙන් ගත් කළ පරිසරික සම්පත් නිෂ්පාදන (Production) සම්පත් හා නිෂ්පාදන නොවන (Non-Production) සම්පත් වශයෙන් වර්ග කරනු ලබයි.

නිෂ්පාදන සම්පත් ලෙස ගැනෙනුයේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදන ක්‍රියාදාමයක යෙදවුම (අමුද්‍රව්‍ය හෝ ශක්තිය) ලෙස භාවිතයට ගනු ලබන පරිසරය ආශ්‍රිත සම්පත්ය (උදාහරණ ලෙස ඛනිජ ද්‍රව්‍ය, ඛනිජතෙල්, ධීවර සහ වන සම්පත් ආදිය).

නිෂ්පාදන නොවන සම්පත් යනු භාණ්ඩ හා සේවා නිපදවීමේ ක්‍රියාවලියට ඍජු සම්බන්ධතාවක් නොමැති, එහෙත් මිනිසාගේ මූලික ජීව අවශ්‍යතාවක් ඉටු කිරීම මගින් හෝ වෙනත් වක්‍ර ආකාරයකින් ආර්ථිකයට මෙහෙයක් ඉටුකිරීම වෙනුවෙන් මිනිසාට ප්‍රයෝජනවත් වන්නකි (උදාහරණ ලෙස වායුගෝලීය සම්පත්, ස්වශනය සඳහා ඔක්සිජන් වායුව, අපද්‍රව්‍ය අවශෝෂණය කර ගැනීම ආදී) (Sterner, 2003).


නිෂ්පාදන සම්පත් ද මූලික කොටස් දෙකකට වර්ග කරනු ලබයි. එනම්, ප්‍රතිස්ථාපනය කළ හැකි (Renewable) සහ ප්‍රතිස්ථාපනය කළ නොහැකි (Non-Renewable) සම්පත් වශයෙනි.


ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත්, ධාරා සම්පත් (Flow Resources), ගබඩා කළහැකි සම්පත් (Storable Resources) සහ ජීව සම්පත් (Biological Resources) වශයෙන් කොටස් තුනකි. ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් සමහර අවස්ථාවල දී ක්ෂය වී යන සම්පත් (Exhausible Resources) ලෙස ද හඳුනාගත හැකිය. එහෙත් මෙකී සම්පත් පුළුල් වශයෙන් සළකා බැලීමේ දී ප්‍රතිචක්‍රීකරණය කළ හැකි (Recyclable) සහ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි (Non-Recyclable) සම්පත් වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකිය (Freeman, 1999).

නිෂ්පාදන නොවන ස මෙකී වර්ගීකරණයන්ට අනුව විවිධ බලශක්ති ප්‍රභවයන් හඳුනාගැනීම පහසු කරවන අතර තුලිත බලශක්ති පරිභෝජන සැළසුම් සඳහා බලශක්ති කළමණාකරණය විය යුත්තේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීමට පහසු කරයි.

පත් ද කොටස් තුනකට වර්ග කර ඇත. එනම්, ජීව සහායක පද්ධතිය (Life Support Systems). මේවායේ උපකාරයකින් තොරව මිනිසුනට සහ වෙනත් ජීවීන්හට තම පැවැත්ම ආරක්ෂාකරගත නොහැක. මෙහි දෙවන කොටස වන්නේ අවශෝෂණ සහ ආරක්ෂණ පද්ධතියයි (Absorptive and Protective Systems). මේවායින් මිනිසාගේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියේ දී නිකුත් කරනු ලබන විවිධ අපද්‍රව්‍ය අවශෝෂණය කරනු ලැබේ. තෙවැනි කාණ්ඩය වන්නේ සෞන්දර්යාත්මක සහ විනෝදාත්මක සම්පත්ය (Aesthetic and Recreational Resources; Amenity Resources). මෙම සම්පත්වලින් මිනිසාට මානසික ආශ්වාදයක් සපයන අතර එමගින් ඍජු උපයෝගිතාවක් ජනනය කරනු ලබයි. මේවායෙහි ආර්ථික ගුණාංග අනුව පොදු භාණ්ඩ (Public Goods) ගණයේ ලා සළකනු ලබයි (Freeman, 1999).

සම්පත් වර්ගීකරණය






ඉහත සම්පත් වර්ගීකරණයට අනුව පෙනීයන වැදගත් කරුණක් වන්නේ සමහර සම්පත් මිනිසාගේ අවශ්‍යතා රාශියක් සපුරාලමින් සිය උපයෝගිතාව නැතිනම් තෘප්තිය උපරිම කරනු ලබන බවයි. වායුගෝලය අතවශ්‍ය ජෛව සහායක පද්ධතියක් වන අතරම අවශෝෂණ හා ආරක්ෂණ පද්ධතියක් ලෙස ද ක්‍රියාත්මක වනු ඇත. විවිධ වනාන්තර පද්ධති බලශක්ති ප්‍රභවයක් වශයෙන් දර ඇතුළු ව දැව සහ වෙනත් වන සම්පත් ලබා දෙන අතරම ජෛව විවිධත්වය ද රැකගනී. එපමනක් නොව මිනිසාට සෞන්දර්යාත්මක වින්දනයක් ලබාදීමට ද වනාන්තර සමත්වන්නේය. මෙබඳු බහුකාර්ය සම්පත් එනම් සංයුක්ත සම්පත් (Composite Resources) ලෙස හඳුන්වනු ලබයි. බලශක්ති සම්පත් ද මෙම ගණයේ ලා සැළකිය හැකිය. මෙමගින් ඉටුවන විවිධ කාර්යයන් මගින් මිනිසාගේ ආර්ථික අවශ්‍යතා රැසක් සම්පූර්ණ වනු ඇත.

## ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත්

### ධාරා සම්පත්

මෙම සම්පත්වල ප්‍රධානතම ගුණාංගය වන්නේ එහි සැපයුම මිනිසාගේ පාලනයෙන් පරිබාහිරව තිබීමත්, ඒවා ලැබෙන අවස්ථාවේදීම භාවිතයට ගතයුතු වීමත්ය. එසේ නැතහොත් විශේෂ ක්‍රම යොදා ගනිමින් ගබඩාකර ගතයුතු වන අතර භාවිතයට ගැනීමට හෝ ගබඩා කිරීමට නොහැකි වන කොටස් අපතේ යනු ඇත. උදාහරණ ලෙස සූර්යාගෙන් ලැබෙන විවිධ කිරණමය ශක්ති විශේෂයන් පෙන්වා දිය හැකිය. සීමිත ප්‍රදේශයක් සැළකිල්ලට ගත්කළ ජලචක්‍රයේ ක්‍රියාකාරිත්වය තුළින් ලැබෙන වර්ෂාපතන ජලය ද මේ ගණයේ ලා සැළකිය හැකිය. එහෙත් එහි අඛණ්ඩ ධාරා සැපයුමක් නොමැත. සුළං මගින් ලැබෙන ශක්තිය ද මෙම ගණයටම අදාල වන්නේය.

### ගබඩා කළ හැකි සම්පත්

ධාරා සම්පත් ගබඩා කිරීම මගින් ගබඩා කළ හැකි සම්පතක් බවට පත්වනු ඇත. සූර්යාගෙන් ලැබෙන ධාරා සැපයුමක් ඇති සූර්ය විකිරණ ශක්තිය විවිධ ආකාරයට තාපය, විදුලිය වැනි බලශක්ති ප්‍රභව ලෙස ගබඩා කොට අවශ්‍ය පරිදි අවශ්‍ය අවස්ථාවන්වල දී භාවිතයට ගත හැකිය. එමෙන්ම ජල චක්‍රයේ විවිධ අවස්ථාවල දී ජලය මතුපිට හෝ භූගත ජලාශ තුළ ගබඩා කරගත හැකිවන අතර එවිට ගබඩා කරන ලද සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගත හැකිය.

### ජීව විද්‍යාත්මක සම්පත්

අජීවී භෞතික සම්පත් සමඟ සසඳන කළ ජීව විද්‍යාත්මක සම්පත්වල ඇති විශේෂ ගුණාංගය වන්නේ ඒවායේ ඇති සජීවී බවයි. එම නිසාම මිනිසා ද අයත්වන ජෛව ගෝලයේම සංඝටක වන්නේය. මෙම සම්පත් සංකීර්ණ ස්වභාවයක් ගන්නා අතර එම සම්පත්වල පැවැත්ම උදෙසා මිනිසාට මෙන්ම සූර්ය ශක්තිය, වාතය, ජලය සහ පෝෂක ප්‍රදේශ වැනි වෙනත් භෞතික සම්පත්වල ආධාරය අවශ්‍යවනු ඇත. සම්පත් ලෙස සළකා බැලීම සඳහා අවශ්‍ය සෑම ගති ලක්ෂණයක්ම මෙම ජෛව සංඝටක තුළ පවත්නා නිසාම ඒවා ජෛව විද්‍යාත්මක සම්පත් ලෙස සම්පත් ආර්ථිකවිද්‍යා යටතේ සළකා බලනු ලබයි (Sterner, 2003).

## ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත්

පරිභෝජනයත් සමඟම අවසන් වන එනම්, නැවත භාවිතයට ගත නොහැකි වනසේ ක්ෂය වී යන සම්පත් මීට අයත්ය. අඛණ්ඩ පරිභෝජනයත් සමඟ මෙම සම්පත් සංචිත කෙමෙන් අඩුවන අතර එය වැළැක්වීමට හෝ තිබෙන සම්පත් ප්‍රමාණය වර්ධනය කිරීමට හැකියාවක් නොමැත. උදාහරණ ලෙස පෘථිවි අභ්‍යන්තරයෙන් ලබා ගන්නා ඛනිජතෙල්, ගල් අඟුරු, ලෝහ වර්ග පෙන්වා දිය හැක. මෙම සම්පත් සාමාන්‍යයෙන් සංචිත (Reserves) වශයෙන් පවතින අතර විවිධ වර්ගවලට අයත් ඛනිජවලින් හඳුනාගන්නා ලද සංචිත ඇත්තේ සීමිත ප්‍රමාණයකි. මෙතෙක් හඳුනා නොගත් සම්පත් ද පැවතිය හැකි අතර එකී සම්පත් සොයාගනු ලැබුව ද එමගින් සමස්ත භෞතික සංචිත ප්‍රමාණය වැඩි කරගත නොහැකිය (Freeman, 1999).

ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් කොටස් දෙකක් යටතේ වර්ග කළ හැකිය. එනම්, ප්‍රතිචක්‍රීකරණය (Recycle) කළ හැකි සහ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි (Non-Recycle) වශයෙනි. ප්‍රතිචක්‍රීකරණය මගින් සම්පත් එක් වාරයකට වඩා වැඩි වාර ගණනක් නැවත නැවත පරිභෝජනයට ගත හැකිවේ. උදාහරණ ලෙස ගලා යන ජලය මගින් කිහිපවරක් විදුලිය නිපදවීම. ඛනිජතෙල්, ගල් අඟුරු වැනි ඛනිජමය ඉන්ධන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි සම්පත්ය. මෙම සම්පත් භාවිත කරනුයේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය බලශක්ති ලබා ගැනීමට වන අතර ඒවා දහනයට ලක් කිරීමෙන් ශක්තිය නිපදවන නිසා පරිභෝජනයත් සමඟම අවසන් වනු ඇත. මෙවැනි ශක්ති ජනක දහන ක්‍රියාවලියක දී අදාල ද්‍රව්‍යයන් නැවත භාවිතයට ගත නොහැකි වන අයුරින් වායුමය අපද්‍රව්‍යය බවට පත්වේ. මෙම වායුමය අපද්‍රව්‍ය බොහෝවිට අවසානයේ දී වායුගෝලයට එකතුවේ. ශක්ති ජනක දහන ක්‍රියාවලිය මගින් පාරසරික හානි සිදුවන එක් ආකාරයක් වශයෙන් එය හඳුන්වාදිය හැකිය (Freeman, 1999).

### 2.4.3 සම්පත්වල භෞතික ලක්ෂණ තක්සේරු කිරීම

රැන්ඩෙල් (Randall, 1989) විසින් පෙන්වා ඇති ආකාරයට විවිධ සම්පත්වල භෞතික ගුණාංග පිළිබඳ තොරතුරු වඩාත් සංක්ෂිප්තව ගණිතමය ප්‍රකාශ මගින් ඉදිරිපත් කළ හැකිය. එක් එක් සම්පත් කාණ්ඩයන්හි පවත්නා ලක්ෂණයන් ගණිතමය සමීකරණ ලෙස දැකිවීමෙන් එකී කාණ්ඩයන් සතු වෙනස්කම් මෙන්ම පොදු ලක්ෂණයන් ද වඩාත් නිවැරිදිව හඳුනාගත හැකිය. සම්පත්හි භෞතික ලක්ෂණ ආර්ථික ආකෘතීන් තුළින් සංසන්දනාත්මක විශ්ලේෂණයකට යොදා ගැනීමේ හැකියාවකට ද එමඟින් ඉඩ සැලසෙනු ඇත.

ගණිතමය සමීකරණයක් ආශ්‍රයෙන් ධාරා සම්පතක් සළකා බලන්නේ නම්,

$$F_t = R_t + S_t + W_t \qquad (2.1)$$

$F_t$ = t කාලයේ දී ලැබෙන සම්පත් ධාරාව

$R_t$ = t කාලයේ දී භාවිතයට ගත් ප්‍රමාණය

$S_t$ = t කාලයේ දී ගබඩා කළ ප්‍රමාණය

$W_t$ = t කාලයේ දී අපතේ ගිය ප්‍රමාණය

ගබඩා කළ සම්පතක වර්තමාන (t) කාලය තෙක් කිසියම් දීර්ඝ කාල පරාසයක් තුළ [T = (t - 1)] ගබඩා කළ සම්පත් ප්‍රමාණය ඉහත ධාරා සම්පත් විස්තර කිරීමට යොදාගත් පරාමිතීන් ආශ්‍රයෙන් ප්‍රකාශ කරන්නේ නම්,

$$S_t = \sum (F_t - R_t - W_t) + F_t \qquad (2.2)$$

ජීව විද්‍යාත්මක සම්පතක ගුණාංග සංකේතාත්මකව දක්වන්නේ නම්, (මෙහි දී සම්පත් ප්‍රමාණය ජෛව ස්කන්ධයක් ලෙස සළකනු ලබයි)

$$S_t = S_0 - \sum (R_t - H_t) \qquad (2.3)$$

$S_t$ = වර්තමාන ජෛව ස්කන්ධය

$S_o$ = ආරම්භක ජෛව ස්කන්ධය

$R_t$ = T කාල පරාසයේ දී සිදුවූ ශුද්ධ නව එකතුවීම්

$H_t$ = t කාල පරාසයේ දී නෙලාගත් ජෛව ස්කන්ධය

මෙම සමීකරණයෙන් පෙන්නුම් කෙරෙන වැදගත් කරුණක් වන්නේ නෙලාගත් සම්පත් ප්‍රමාණය නව ශුද්ධ එකතුවීම්වලට සමාන වන්නේ නම්, ($R_t = H_t$) අදාල සම්පත් ජෛව ස්කන්ධය නියතව පවතින්නකි. ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් හි භෞතික ගුණාංග සංකේතාත්මකව දක්වන්නේ නම්,

$$S_t = S_0 - \sum R_t \qquad (2.4)$$

$S_t$ = වර්තමාන සංචිත ප්‍රමාණය

$S_o$ = ආරම්භක සංචිත ප්‍රමාණය

$R_t$ = (t-1) කාල පරාසය දක්වා භාවිතයට ගැනුණු මුළු
සම්පත් ප්‍රමාණය

මෙම (2.4) සමීකරණයේ $S_t$ යනුවෙන් දක්වා ඇත්තේ විභව සංචිත ද අඩංගුව වර්තමානයේ පවතින මුළු සත්‍ය භෞතික සංචිත ප්‍රමාණයයි. ප්‍රයෝගිකව ගත් කළ මෙම අගය නිශ්චිතවම නොදන්නා නිසා ඡායා (Shadow) සංචිත $\hat{s}$ ලෙස අර්ථ දක්වා මෙම සම්බන්ධය දැක්විය හැක.

$$\hat{s}_t = \hat{s}_o - \sum (R_t - E_t) \qquad (2.5)$$

$E_t$ = t-1 කාලය තුළ දී ගවේශණ මගින් සොයා ගත් නව සම්පත්
ප්‍රමාණය

ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් සංකේතාත්මකව විස්තර කරන්නේ නම්, ඉහත (2.4) සමීකරණය ප්‍රතිචක්‍රීකරණය ද ඇතුළත් වන සේ ඉදිරිපත් කරන්නේ නම්,

$$S_t = S_0 - \sum (R_t - E_t - C_t) \qquad (2.6)$$

$C_t$ = t කාල පරාසයේ දී ප්‍රතිචක්‍රීකරණය කළ සම්පත් ප්‍රමාණය

මෙකී ගණිතමය සම්බන්ධතාවන් මගින් විවිධ සම්පත් වර්ගයන්හි වටිනාකම් තක්සේරු කිරීමේ හැකියාවක් පවතී. මේ යටතේ පාරසරික සම්පත්හි වටිනාකම් පිළිබඳ සංකල්පය සළකා බලනු ලබයි. වටිනාකම යන්නෙන් කිසියම් සම්පතක් අනෙකුත් සම්පත්වලට (භාණ්ඩ හා සේවා) සාපේක්ෂව ආර්ථිකයක සාමාජිකයින් විසින් කෙතරම් අගය කරන්නේ ද යන්න මෙහි මූලික අදහස වනු ඇත. සම්පතකට වටිනාකමක් හිමි කර දෙන කරුණු කිහිපයකි.

(අ) සම්පතකට මිනිස් අවශ්‍යතාවන් සැපිරීමේ ඇති හැකියාව, එනම්, උපයෝගිතාවක් ජනනය කිරීමේ හැකියාව වනු ඇත.

(ආ) මිනිස් අවශ්‍යතාවනට සාපේක්ෂව හිඟවීම.

(ඇ) සම්පතක් භාවිත කිරීමේ දී ආවස්ථික පිරිවැයක් දැරීමට සිදුවීම.

පාරසරික සම්පත් හි වටිනාකම පිළිබඳ සංකල්පය ගතික හා සාපේක්ෂ ස්වභාවයක් ගනී. කිසියම් සම්පතක වටිනාකම කාලයත් සමග නියතව නොපවතින අතර ආර්ථිකය තුළ එයට ඇති ඉල්ලුම වෙනස් වන විට ඒ අනුව ඒවායේ වටිනාකම ද කාලයෙන් කාලයට වෙනස් වන්නේය. එමෙන්ම භූගෝලීය වශයෙන් රටින් රටට ප්‍රදේශයෙන් ප්‍රදේශයට ද වටිනාකම වෙනස් වීමට ඉඩ ඇත. බලශක්ති සම්පත්හි මෙකී ගති ලක්ෂණ පැහැදිලිව හඳුනාගත හැකිය (Gunathilake, 2003).

## 2.4.4 සම්පත්වල ආර්ථික වටිනාකම

ගෝලීය ආර්ථික සංදර්භය තුළ සම්පතක වටිනාකම බොහෝ විට එහි වෙළෙඳපොළ මිල මගින් ප්‍රකාශකරනු ලබයි. රජය හෝ වෙනත් බාහිර බලපෑමක් නොමැති වන්නේ නම්, පූර්ණ තරගකාරී ආර්ථිකයක දී සම්පතකට හිමි මිල තීරණය වනුයේ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් බලවේගයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය යටතේය. සම්පතක් සඳහා ඇති ඉල්ලුම ජනනය වනුයේ මිනිස් අවශ්‍යතාවන් සැපිරීමේ ඊට ඇති හැකියාව මතය. ඉල්ලුමට සාපේක්ෂව එහි ඇති හිඟකම සැපයුම තීරණය කරනු ලබන ප්‍රධානතම සාධකය වන්නේය. මේ ආකාරයට මිල ක්‍රමය තුළින්ම පාරසරික සම්පත් සඳහා ද මිල තීරණය කරන විටෙක අදාල සම්පත්වලට සාපේක්ෂ වටිනාකමක් හිමිවනු ඇත. එහෙත්

ප්‍රායෝගික වෙළෙඳපොළ තත්ත්වය සළකා බැලීමේ දී සම්පත් සඳහා රජය සහ බාහිර බලවේගයන්ගේ මැදිහත්වීම් දක්නට ලැබේ. එකී මැදිහත්වීම් තරගකාරීත්වයට බාධාවන් වන්නේය. එම නිසාම සම්පත් හි වටිනාකම තීරණය කිරීමෙහි ලා සුදුසු අංග සම්පූර්ණ මිණුම් දණ්ඩක් වශයෙන් එහි වෙළෙඳපොළ මිල පිළිගත හැකි ප්‍රයෝජනවත් මිණුමක් නොවන බවට ද මතයක් පවතී (Gunathilake, 2003).

ඛනිජතෙල්, ගල් අඟුරු, දැව, වැනි නිෂ්පාදන සම්පත් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය තුළින් භාවිතයට ගැනෙන අතර මෙබඳු සම්පත්වල වටිනාකම ගණනය කිරීමේ දී ඒවායේ වෙළෙඳපොළ මිල සකස්කිරීම් සහිතව භාවිත කරනු ලබයි. ආර්ථිකවිද්‍යාවේ පොදු වෙළෙඳපොළ සමීකරණය මගින් එය පෙන්නුම් කරනු ඇත.

වටිනාකම = (ඒකකයක මිල x ඒකක ප්‍රමාණය)

වෙළෙඳපොළ මගින් තීරණය වූ මිලක් සහිත ඕනෑම භාණ්ඩයක් සඳහා මෙම සමීකරණය ආශ්‍රයෙන් අදාල වටිනාකම ගණනය කළ හැකිය. එහෙත් මෙහි දී මතතුවන මූලික ගැටලුවක් වන්නේ වෙළෙඳපොළ මිල මගින් කෙතරම් නිවැරිදිව අදාල සම්පතේ වටිනාකම නිරූපනය කරන්නේ ද යන්නයි. වෙළෙඳපොළ මිල වටිනාකම පිළිබඳව නිවැරිදි මිණුමක් වීමට නම්, එය තරගකාරිත්වය තුළ බාහිර මැදිහත්වීම් වලින් තොරව, ඉල්ලුම් සහ සැපයුම් බලවේගවල අන්තර් ක්‍රියාකාරීත්වය තුළින්ම නීර්ණය වූවක් විය යුතුය. එහෙත් මෙම කොන්දේසි ප්‍රයෝගික මට්ටමේ දී ප්‍රමාණවත් අයුරින් සපුරාලීම දුෂ්කර කටයුත්තකි. එබැවින් ඊට පිළියමක් වශයෙන් ඡායා මිල (Shadow price) යන සංකල්පය ආර්ථිකවිද්‍යාව තුළ භාවිත කරනු ලබයි. කිසියම් භාණ්ඩයක හෝ සේවාවක නිරීක්ෂණය කරනු ලැබූ (Observed) වටිනාකමක් පවතිනු ඇත. එකී වටිනාකම අදාල භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති වෙළෙඳපොළ තරගකාරීත්වය පදනම් කොට ගණනය කරනු ලබන පරිවර්තන සංගුණකය (Conversion Factor) මගින් තීරණය කරනු ලබයි. මෙම පරිවර්තිතය ඡායා මිල වන අතර එය අදාල භාණ්ඩයේ හෝ සේවාවේ නිවැරිදි ආර්ථික වටිනාකම පිළිබිඹුවක් සේ සැළකේ. එකී පදනම මත ඉහත සමීකරණය සංශෝධනය කළ හොත්,

ආර්ථික වටිනාකම = (පරිවර්ත සාධකය x වෙළෙඳපොළ නිරීක්ෂිත ඒකකයක මිල x ඒකක ප්‍රමාණය)

උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් වෙළෙඳපොළ, විදුලිබල වෙළෙඳපොළ රාජ්‍ය ඒකධිකාරියක් වන අතර එහි මිල තීරණයවීම ඉල්ලුම් හා සැපයුම් බලවේගයන්ගේ ක්‍රියාකාරීත්වයට වඩා වෙනත් බලපෑම් මත තීරණය වූ මිලක් පවතී. එමනිසා පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය උපරිම වීම යන පොදු සිද්ධාන්තය බලශක්ති වෙළෙඳපොළ සඳහා නොගැලපෙනු ඇත. මෙකී තත්ත්වය යටතේ බලශක්ති වෙළෙඳපොළේ අසමතුලිතයක් පවතිනවාය යන්න බැහැර කළ නොහැකි කරුණක් වනු ඇත.

## 2.5 සමාලෝචනය

මානව වර්ගයාගේ ආරම්භයේ සිට වර්තමානය දක්වාම මිනිසාගේ හැසිරීම පරිසරය සමඟ බද්ධව පැවතෙන්නකි. එනම්, දඩයම් යුගය, කෘෂිකාර්මික යුගය, කාර්මික යුගය සහ වර්තමාන තාක්ෂණික යුගය දක්වා මිනිසා පැමිණ ඇත්තේ බෙදා වෙන් කළ නොහැකි ආකාරයට පාරසරික සම්පත් සහ සම්බන්ධ වී ඒවා විවිධාකාරයෙන් පරිභෝජනය කිරීමෙනි. එකී පාරසරික සම්පත් පරිභෝජනය අතර බලශක්ති සම්පතට විශේෂත්වයක් හිමි වේ. ඊට හේතු වන්නේ පරිසරයෙන් ලැබෙන්නා වූ බලශක්ති සම්පත් තම පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වීමයි. මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා එකී සම්පත් විවිධාකාරයෙන් හැඩගස්වා ගනිමින් නිෂ්පාදන ක්‍රියාවලියට ඍජුව හෝ වක්‍රව දායක කර ගනු ලබයි. පරිසරයෙන් ලබාගන්නා වූ බලශක්ති සම්පත් ද අනෙකුත් බොහෝ පාරසරික සම්පත් මෙන් පරිභෝජනයත් සමඟම ක්ෂය වී යාමේ අවදානමක් පවතී. එහෙත් ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත් ද පරිසරය තුළින්ම ලබා ගැනීමේ හැකියාවක් පවත්නා නිසාම එකී අවදානම අවම කර ගත හැකිය. එම නිසා, අනාගත පරම්පරාවන්හි අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් ආරක්ෂා කර ගැනීමට නම්, එකී සම්පත් පරිභෝජනය අවම කර ගනිමින් ඒ වෙනුවට ප්‍රතිස්ථාපනය කළ හැකි විකල්ප සම්පත් පරිභෝජනය කළ යුතුය. බලශක්ති සම්පත් පරිභෝජන මේ යටතේ විශේෂත්වයක් ගනු ලබයි. තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට නම්, තුලිත බලශක්ති පරිභෝජන සැලැස්මක් අතවශ්‍ය වන්නකි. බලශක්ති පරිභෝජන ව්‍යුහයට අනුව කර්මාන්ත අංශය, ප්‍රවාහන අංශය, කෘෂිකාර්මික අංශය ඇතුළුව නිදහස් වෙළෙඳපොළ ක්‍රමය යටතේ ලාභ සංකල්පය ක්‍රියාත්මක වන්නේ නම්, බලශක්ති යෙදවුම්හි කිසියම් පාලනයක් තිබිය යුතුය. එහෙත් එවැනි තත්ත්වයක් පවතිය හැක්කේ පරිසරයෙන් ලැබෙන්නා වූ බලශක්ති සම්පත් පොදු භාණ්ඩ වශයෙන් නොපවතින්නේ නම් පමණෙකි. වෙළෙඳපොළ ලාභ සංකල්පයෙන් තොරව, පාරිභෝගික තෘප්තිය හා සුබසාධනය වැනි සාධක මත

බොහෝ විටෙක කටයුතු කෙරෙන ගෘහස්ථ බලශක්ති පරිභෝජනයේ දී තුලිත සැළැස්මක් පවතින්නේ ද යන්නත්, එවැනි සැලැස්මක් නොපවතින්නේ නම්, ඊට හේතු මොනවා ද යන්නත්, තුලිත බලශක්ති පරිභෝජන සැලැස්මක් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මොනවා ද යන්නත්, සොයා බැලිය යුතුය. එකී කාර්යයන් සඳහා යම්කිසි පදනමක් සකස්කර ගැනීම මෙම පරිච්ඡේදය යටතේ සිදුකොට ඇත.